92167

OL/2010/81-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | |
|---|---|
| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I, II | පැය තුනයි |
| விவசாயம் உணவுத் தொழினுட்பவியலும் I, II | மூன்று மணித்தியாலம் |
| Agriculture and Food Technology I, II | *Three hours* |

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. යුරෝපීය ආක්‍රමණ නිසා මෙරට යැපුම් කෘෂිකර්මය, වාණිජ කෘෂිකර්මය බවට පත් විය. මෙසේ වාණිජකරණය නිසා ප්‍රධාන වගා බවට පත්වූයේ
   (1) පොල්, තේ, රබර් හා කෝපි ය.
   (2) වී, කුරුඳු, මිරිස් හා පොල් ය.
   (3) පොල්, පුවක්, කිතුල් හා කුරුඳු ය.
   (4) තේ, පොල්, පුවක් හා වී ය.

2. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුල ලෙස පැතිරී ඇති මහා පස් කාණ්ඩය වනුයේ
   (1) රතු කහ පොඩ්සලික් පස් ය.
   (2) රතු දුඹුරු ලැටසොලික් පස් ය.
   (3) රතු ලැටසොලික් පස් ය.
   (4) රතු දුඹුරු පස් ය.

3. සිසුහු පිරිසක් පාසල් ගොවිපොළේ ඉඟුරු, රතුළුණු සහ ගොටුකොළ වගා කළහ. මෙහිදී රෝපණ ද්‍රව්‍ය ලෙස ඔවුන් භාවිත කර ඇත්තේ පිළිවෙළින්
   (1) කෝම, රෛසෝම හා ආකන්ද ය.
   (2) රෛසෝම, බල්බ හා ධාවක ය.
   (3) බල්බ, කෝම හා ආකන්ද ය.
   (4) ධාවක, බල්බ හා රෛසෝම ය.

4. ගොවියෙක් තම කරවිල වගාවේ පෙරමෝන උගුලක් සවිකර තැබුවේ ය. මේ මගින් පාලනය කිරීමට බලාපොරොත්තු වන පළිබෝධය වන්නේ
   (1) ඉල්මැස්සා ය. (2) අවුලකපෝරා ය. (3) කුඩිත්තා ය. (4) පලතුරු මැස්සා ය.

5. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් මිශ්‍ර බෝග වගාව පිළිබඳ ව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ඒකීය වර්ගඵලයකින් ලබා ගත හැකි අස්වැන්න වැඩි වේ.
   (2) පාංශු ඛාදනය හා හායනය වැඩි වේ.
   (3) වගාවේ පශ්චාත් සාත්තු පහසු වේ.
   (4) වගාවේ පළිබෝධ හානි වැඩි වේ.

6. ගොවියෙක් වී වගාවෙන් ලැබෙන පිදුරු තම ගවයින්ට ආහාර පිණිස ලබාදෙයි. එම ගවයින්ගේ අපද්‍රව්‍ය ඇසුරෙන් ජීව වායුව නිපදවයි. ජීව වායු ඒකකයෙන් ඉවතලන දෑ, බෝගවලට පොහොර ලෙස යොදයි. මෙම ගොවිතැන හැඳින්විය හැක්කේ
   (1) සංරක්ෂණ ගොවිතැන ලෙස ය.
   (2) වියළි ගොවිතැන ලෙස ය.
   (3) සමෝධානිත ගොවිතැන ලෙස ය.
   (4) සෂ්‍ය මාරු ගොවිතැන ලෙස ය.

7. ගොවියකුට අන්නාසි වගාවක් ආරම්භ කිරීම සඳහා මොරෙයියන් අවශ්‍ය විය. ඒ සඳහා වඩාත් සුදුසු වන්නේ
   (1) කරඬු මොරෙයියන් ය.
   (2) නටු මොරෙයියන් ය.
   (3) මුල් මොරෙයියන් ය.
   (4) අක්ෂි මොරෙයියන් ය.

8. පත්‍ර හා දඬු කැබලි මගින් ශාක ප්‍රචාරණය කිරීමේදී සැපයිය යුතු වන්නේ
   (1) වියළි, සිසිල් පරිසරයකි.
   (2) උණුසුම්, ආර්ද්‍ර පරිසරයකි.
   (3) වියළි, උණුසුම් පරිසරයකි.
   (4) තෙත්, අඳුරු පරිසරයකි.

[ දෙවැනි පිටුව බලන්න.

9. අතින් ඉදිරීමෙන් හා උදළු ගෑමෙන් පාලනය කිරීමට අපහසු වල්පැළෑටි යුගලයක් වන්නේ
(1) මොනරකුඩුම්බිය හා ගැටකොළ ය. (2) ඇටෝරා හා කලාදුරු ය.
(3) නිදිකුම්බා හා කලාදුරු ය. (4) මොනරකුඩුම්බිය හා ඇටෝරා ය.

10. අවුලකපෝරා කුරුම්ණියා, කුකර්බිටේසියේ කුලයේ බෝගවලට බහුලව හානි පමුණුවයි. මොහුගේ ජීවන චක්‍රයේ හානිකර වන්නේ
(1) කීට අවස්ථාව ය. (2) කීට හා පිලා අවස්ථා ය.
(3) පිලා හා සුහුඹුල් අවස්ථා ය. (4) කීට හා සුහුඹුල් අවස්ථා ය.

11. ශිෂ්‍යයකුට තම ගෙවත්තේ බතල, ගොටුකොළ හා කෙසෙල් වගා කිරීමට අවශ්‍ය විය. මෙම බෝග සඳහා නිර්දේශිත පාත්ති වර්ග වන්නේ පිළිවෙළින්
(1) වැටි සහ කාණු, ගිල්වූ පාත්ති හා තනි වගා වළවල් ය.
(2) ගිල්වූ පාත්ති, තනි වගා වළවල් හා වැටි සහ කාණු ය.
(3) උස් වූ පාත්ති, තනි වගා වළවල් හා වැටි සහ කාණු ය.
(4) උස් වූ පාත්ති, ගිල්වූ පාත්ති හා තනි වගා වළවල් ය.

12. එළවලු පැළ උදුරා සිටුවීමේදී මුල්වලට සිදුවන හානිය අවම වන සේ තවාන් පැළ නිෂ්පාදනය කිරීමට වඩාත් සුදුසු තවාන් ක්‍රමය වනුයේ
(1) තවාන් පාත්තියේ පෙළට බීජ දැමීම ය. (2) පොලිතින් බඳුන් තුළ සමූහ තවාන් සකස් කිරීම ය.
(3) නොරිඩෝකෝ ක්‍රමයට තවාන් කිරීම ය. (4) ඩැපොග් ක්‍රමයට තවාන් කිරීම ය.

13. පහත දැක්වෙන සාධක සලකා බලන්න.
*A* - උච්චත්වය
*B* - සමකයේ සිට ඇති දුර
*C* - ප්‍රදේශයේ පස් කාණ්ඩ
*D* - අවට ශාක ගහනය
එම සාධක අතුරෙන් පරිසර උෂ්ණත්වය කෙරෙහි බලපාන සාධක වනුයේ
(1) *A*, *B* හා *C* පමණි. (2) *A*, *B* හා *D* පමණි. (3) *B*, *C* හා *D* පමණි. (4) *A*, *B*, *C*, *D* සියල්ලම ය.

14. ශක්ති ජනක, වර්ධක හා ආරක්ෂක යන ආහාර වර්ගවලට අයත් ආහාර කාණ්ඩ වනුයේ අනුපිළිවෙළින්
(1) පලතුරු, එළවලු හා ධාන්‍ය ය. (2) එළවලු, පලතුරු හා මාෂ බෝග ය.
(3) පලා වර්ග, ධාන්‍ය හා මස් නිෂ්පාදන ය. (4) ධාන්‍ය, මාෂ බෝග හා එළවලු ය.

15. ගංගා හරස්කර වැව් තැනීම සම්බන්ධ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
*A* - මල්වතු ඔය හරස්කොට බසවක්කුලම වැව තනා ඇත.
*B* - කලා ඔය හරස්කොට කලා වැව තනා ඇත.
*C* - ගල් ඔය හරස්කොට සේනානායක සමුද්‍රය තනා ඇත.
මෙම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* හා *B* පමණි. (2) *A* හා *C* පමණි. (3) *B* හා *C* පමණි. (4) *A*, *B* හා *C* සියල්ලම ය.

16. ආලෝකය පවතින කාලසීමාව සමහර බෝගවල පුෂ්පීකරණයට බලපායි. මෙම සිද්ධිය හඳුන්වනු ලබන්නේ
(1) ප්‍රභා අවධි සංවේදීතාව වශයෙනි. (2) වසන්තීකරණය වශයෙනි.
(3) සූර්ය දීප්තමානය වශයෙනි. (4) ප්‍රභාසංස්ලේෂණය වශයෙනි.

17. ප්‍රභාසංස්ලේෂණයේදී සිදුවන රසායනික විපර්යාසය පෙන්වන නිවැරදි සමීකරණය කුමක් ද?
(1) $CO_2 + H_2O \longrightarrow C_6H_{12}O_6 + 2O_2$ (2) $6CO_2 + 6H_2O \longrightarrow C_6H_{12}O_6 + 6O_2$
(3) $C_6H_{12}O_6 + O_2 \longrightarrow CO_2 + H_2O$ (4) $6CO_2 + 6H_2O \longrightarrow 6C_6H_{12}O_6 + O_2$

18. පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
*A* - ශ්‍රී ලංකාව තෙත් හා වියළි වශයෙන් ප්‍රධාන දේශගුණික කලාප දෙකකට බෙදී ඇත.
*B* - තෙත් කලාපයට ප්‍රධාන වශයෙන් නිරිත දිග මෝසම් සුළඟින් ද වියළි කලාපයට ප්‍රධාන වශයෙන් ඊසාන දිග මෝසම් සුළඟින් ද වර්ෂාව ලැබේ.
*C* - නිරිත දිග මෝසම් සුළං වර්ෂාවෙන් වගා කෙරෙන කාලය "මහ කන්නය" ද ඊසාන දිග මෝසම් සුළං වර්ෂාවෙන් වගා කෙරෙන කාලය "යල කන්නය" වශයෙන් ද හැඳින්වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* හා *B* ය. (2) *A* හා *C* ය. (3) *B* හා *C* ය. (4) *A*, *B* හා *C* සියල්ලම ය.

[ තුන්වැනි පිටුව බලන්න.

19. ශීත දේශගුණයක් පවතින උඩරට ප්‍රදේශයේ පමණක් නොව උෂ්ණ දේශගුණයක් පවතින යාපනයේ ද අර්තාපල් වගා කර සාර්ථක අස්වැන්නක් ලබාගත හැකි ය. එම සාර්ථකත්වයට හේතුව වන්නේ

(1) දහවල් ශීත දේශගුණය හා උණුසුම් රාත්‍රියයි.
(2) අධික වර්ෂාපතනය හා අධික ආර්ද්‍රතාවයි.
(3) තද සුළං සහිත රාත්‍රිය හා උෂ්ණත්වය අඩු දහවල් කාලයයි.
(4) උණුසුම් දහවල් කාලය හා ශීත රාත්‍රී කාලයයි.

20. කොම්පෝස්ට් යනු අර්ධ වශයෙන් ජීර්ණය වූ කාබනික ද්‍රව්‍ය වේ. කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී කාබනික ද්‍රව්‍ය දිරාපත් වීම වේගවත් කිරීම සඳහා 'මුහුන්' වශයෙන් භාවිත කෙරෙනුයේ

(1) දිය ගැසූ හුනු ස්වල්පයකි. (2) දව අළු ස්වල්පයකි.
(3) රසායනික පොහොර ස්වල්පයකි. (4) පරණ කොම්පෝස්ට් ස්වල්පයකි.

21. වර්තමානයේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව දැඩි අවධානයක් යොමු වී ඇත. ආහාර සුරක්ෂිතතාව යනුවෙන් අදහස් කෙරෙන්නේ

(1) ආහාරවලට සාධාරණ මිලක් ලබාදීමයි.
(2) ආහාර නරක් නොවී දීර්ඝ කාලයක් ගබඩා කර තබා ගැනීමයි.
(3) අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණයෙන් හා ගුණාත්මයෙන් යුතු ආහාර ලබා ගැනීමට ඇති හැකියාවයි.
(4) ආහාර හිඟ වූ රටවලට වහාම ගුවන් මඟින් ආහාර ලබාදීමයි.

22. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
කුකුළු පාලනයේ විවිධ අවස්ථාවලදී නුසුදුසු පක්ෂීන් රැලෙන් ඉවත් කිරීමෙන්

*A* - විශාල බිත්තර ලබාගත හැකි ය.
*B* - බිත්තර දැමීම ඉක්මනින් ආරම්භ කළ හැකි ය.
*C* - ආහාර සඳහා යන වියදම අඩුකරගත හැකි ය.
*D* - නිවාසවල ඉඩ කාර්යක්ෂමව භාවිත කළ හැකි ය.

මේවා අතුරෙන් සත්‍ය වන්නේ

(1) *A* හා *B* පමණි. (2) *A* හා *C* පමණි. (3) *B* හා *C* පමණි. (4) *C* හා *D* පමණි.

23. පාසල් සෞඛ්‍ය වෛද්‍ය පරීක්ෂණයකදී සමහර සිසුන්ගේ ඇස් පෙනීම දුර්වල බවත්, රාත්‍රී අන්ධතාවයෙන් පෙළෙන බවත්, හම ගොරෝසු බවත් අනාවරණය විය. මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් වැඩියෙන් ආහාරයට ගත යුතු වන්නේ

(1) කව්පි, කඩල, පරිප්පු, මුං, සෝයා බෝංචි (2) ගොටුකොළ, මුගුණුවැන්න, කැරට්, සාරණ, බිත්තර කහමද
(3) බත්, මාළු, කිරි, බිත්තර, වැටකොලු (4) බතල, අර්තාපල්, බීට්, රාබු, නෝකෝල්

24. ගොවි මහතෙක් පෞද්ගලික පැළ තවානකින් තැඹිලි පැළයක් මිලට ගෙන තම ගෙවත්තේ වගා කළේ ය. නමුත් එය පිදුනු විට එහි හටගත්තේ තැඹිලි නොව පොල් ය. මෙම තත්ත්වයට හේතු විය හැක්කේ

(1) එම තැඹිලි පැළයට පොල් පොහොර යෙදීම ය.
(2) එම තැඹිලි පැළයේ මව් ශාකය පරපරාගණයට ලක් වීම ය.
(3) එම තැඹිලි පැළය වගා කර ඇත්තේ පොල් වගාවට සුදුසු බිමක වීම ය.
(4) එම තැඹිලි පැළය මයිටාවන්ගේ හානියට ලක් වීම ය.

25. මෙම රූපයෙන් දැක්වෙන ආකාරයට අනුව ප්‍රරෝහණය වන බීජ මොනවා ද?




(1) වට්ටක්කා, බෝංචි, දඹල, බණ්ඩක්කා
(2) බෝංචි, කව්පි, කඩල, පොල්
(3) බඩඉරිඟු, පොල්, කඩල, රටකජු
(4) කව්පි, මෑ, වට්ටක්කා, බඩඉරිඟු,

26. කුකුළු පාලනයේදී වැඩිම ප්‍රෝටීන ප්‍රතිශතයක් අඩංගු ආහාර සලාකයක් දිය යුත්තේ

(1) බිත්තර දමන සතුන්ට ය. (2) නැම්බියන්ට ය.
(3) වැඩෙන සතුන්ට ය. (4) පැටවුන්ට ය.

27. මව් ශාකයෙන් වෙන් කර ගන්නා ලද ශාක සෛලයක් හෝ පටකයක් විශේෂිත රෝපණ මාධ්‍යයක ජීවාණුහරිත තත්ත්ව යටතේ වර්ධනය කර ගැනීම

(1) පටක රෝපණය නම් වේ. (2) ජාන තාක්ෂණය නම් වේ.
(3) ජාන ඉංජිනේරු විද්‍යාව නම් වේ. (4) බහු කලලතාව නම් වේ.

28. බෝගයට පොහොර යෙදූ විගස වර්ෂාවක් ඇති වුව ද එම පොහොර සේදී නොගොස් පසේ රඳා පැවතීමට හේතු වන්නේ

(1) පසේ පවතින පාංශු වාතය ප්‍රමාණයයි. (2) පසේ කැටායන හුවමාරු ධාරිතාවයි.
(3) පසේ ආම්ලිකතාවයි. (4) පසේ pH අගයයි.

92167

29. රූප සටහනේ දක්වෙන්නේ සිසුන් විසින් පස පිළිබඳව කරන ලද පරීක්ෂණයක ඇටවුමකි. සෑම පුනීලයකටම වියළන ලද විවිධ පස් සාම්පලවලින් සමාන පරිමා දමා සෑම සාම්පලයකටම සමාන ජල පරිමා යොදන ලදී.




රූපයේ දක්වෙන නිරීක්ෂණ අනුව, ඉහත පස් සාම්පල අතුරෙන් වැඩි මැටි ප්‍රතිශතයක් අඩංගු පස් සාම්පලය වන්නේ
(1) *A* ය. (2) *B* ය. (3) *C* ය. (4) *D* ය.

30. ගොයම් ශාකවල පර්ව දික්වීම, පටක මාංශල වීම, ශාක ඇද වැටීම හා අධිකව පළිබෝධ හානිවලට ලක්වීම සිදුවන්නේ
(1) යකඩ අධික වීම නිසා ය. (2) නයිට්‍රජන් අධික වීම නිසා ය.
(3) පොස්පරස් අධික වීම නිසා ය. (4) පොටෑසියම් අධික වීම නිසා ය.

31. දිවා කාලයේදී ගවයකු දිගෙලි කර ආහාර ගැනීමට සලස්වනු ලබන අතර රාත්‍රී කාලයේදී ගව නිවාසයක බැඳ ආහාර ලබා දේ. මෙසේ ගවයින් ඇති කෙරෙන ක්‍රමය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) නිදැලි ක්‍රමය (2) අඩසියුම් ක්‍රමය (3) සියුම් ක්‍රමය (4) ඩීප් ලිටර් ක්‍රමය

32. කුකුළු කොටුවක බිත්තර එක්රැස් කිරීම ප්‍රමාද කිරීමෙන්
(1) කිකිළියන්ගේ ඇන කොටා ගැනීම වැඩි වේ. (2) කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩු වේ.
(3) බිත්තරවල පෝෂණ ගුණය අඩු වේ. (4) බිත්තර අපිරිසිදුවීමට හා විනාශවීමට ඇති ඉඩකඩ වැඩි වේ.

33. ගවදෙනකගේ කිරි මුරයක සම්මත දිග, දින
(1) 360 කි. (2) 305 කි. (3) 285 කි. (4) 60 කි.

34. ගවගාලක් ඇතුළත කාණු සෑදීම මගින් බලාපොරොත්තු වන්නේ
(1) කාණුවල ජලය ගලායාමට සලස්වා ගවයින්ට බීමට ජලය සැපයීමට ය.
(2) සාන්ද්‍ර ආහාර ජලයේ දියකර කාණු දිගේ ගලා යාමට සලස්වා ගවයන්ට ආහාර සැපයීමට ය.
(3) කාණු දිගේ ජලය ගලායාමට සලස්වා එමගින් ගවගාල තුළ සිසිලසක් ඇති කිරීමට ය.
(4) ගොම, ගව මූත්‍ර ආදිය කාණු ඔස්සේ සෝද හැරීම පහසු කිරීමට ය.

35. ගොවිපොළක ජීව වායු ඒකකයක් පිහිටුවීමෙන් අපේක්ෂා කෙරෙනුයේ
*A* - ගොවිපොළට අවශ්‍ය බලශක්තිය ලබා ගැනීම ය.
*B* - ගොවිපොළට අවශ්‍ය කාබනික පොහොර නිපදවීම ය.
*C* - සත්ත්ව මල මූත්‍රවලින් එන දුර්ගන්ධය වළක්වා පරිසරය පිරිසිදුව තබා ගැනීම ය.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* හා *B* පමණි. (2) *A* හා *C* පමණි. (3) *B* හා *C* පමණි. (4) *A*, *B* හා *C* සියල්ල ම ය.

36. තෘණ කපා වියළා සත්ත්ව ආහාරයක් වශයෙන් සංරක්ෂණය කරගත් විට එය හඳුන්වනු ලබන්නේ
(1) සයිලේජ් ලෙස ය. (2) හේ ලෙස ය.
(3) ගෝචර තෘණ ලෙස ය. (4) පෝෂ තෘණ ලෙස ය.

37. ශ්‍රී ලංකාවේ පහත රට වියළි කලාපයේ ඇති කිරීමට යෝග්‍ය ගව වර්ගයක් වන සහිවාල්
(1) දේශීය වර්ගයකි. (2) ඉන්දීය වර්ගයකි. (3) යුරෝපීය වර්ගයකි. (4) ඇමරිකානු වර්ගයකි.

38. කිරි කල්තබා ගැනීම සඳහා පැස්ටරීකරණය කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී කිරිවල අඩංගු සියලුම
(1) ක්ෂුද්‍ර ජීවීන් විනාශ වේ. (2) රෝග කාරක බැක්ටීරියා විනාශ වේ.
(3) බැක්ටීරියා විනාශ වේ. (4) ප්‍රොටොසෝවා විනාශ වේ.

39. ගවයින්ට දළ ආහාර ලබා දිය යුත්තේ එම සතාගේ ශරීර බරින්
(1) 5 % කි. (2) 10 % කි. (3) 20 % කි. (4) 25 % කි.

40. වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම වර්තමාන ලෝකය මුහුණ පා ඇති ප්‍රධාන පාරිසරික ගැටලුවකි. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලබා දිය හැකි දායකත්වය වන්නේ
(1) වගා කළ හැකි සෑම බිම් අඟලක ම බෝග වගා කිරීම ය.
(2) නව වන වගා හා කෘෂි වන වගා ඇති කිරීම ය.
(3) වැඩි වශයෙන් වැව් තනා කැලෑ එළිකර නව වගා බිම් ඇති කිරීම ය.
(4) කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය අඩුකර වැඩියෙන් හේන් ගොවිතැනට යොමු වීම ය.

※※

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

81 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය I, II
விவசாயம் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය II

※ පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු සපයන්න.

**1.** පාසල් ගොවිපොළක් පිහිටුවීමට අදහස් කළ කෘෂිකර්ම ගුරුමහතෙක් ඒ සඳහා බිම් පිළියෙල කිරීම, බෝග තෝරා ගැනීම සහ පස සංරක්ෂණය කිරීම පිළිබඳව සිසුන් දැනුවත් කළේ ය. පාසල් භූමියේ පස මැටි සහිත නිසරු පසක් බැවින්, පස සාරවත් කරගත යුතු බව ද සිසුන්ට දැනුම් දුන්නේ ය.

(i) මෙම ගොවිපොළේ මූලික බිම් සැකසීම සඳහා භාවිත කළ හැකි උපකරණ **හතරක්** නම් කරන්න.

(ii) මෙම ගොවිපොළේ එළවලු වගා කිරීම සඳහා පිළියෙල කරගත හැකි පාත්ති වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(iii) බීජ තවාන් දමා ලබාගන්නා පැළ පමණක් ක්ෂේත්‍රයේ සිටුවීමට යොදා ගැනෙන එළවලු බෝග වර්ග **දෙකක්** නම් කරන්න.

(iv) එළවලු බීජ තවාන් දැමීම සඳහා යොදා ගැනෙන තවාන් මිශ්‍රණය සකස් කිරීමට භාවිත කෙරෙන ද්‍රව්‍ය මොනවා ද? ඒවා මිශ්‍ර කළ යුතු අනුපාතය සඳහන් කරන්න.

(v) මෙම ගොවිපොළේ වගා කිරීමට සුදුසු සොලනේසියේ කුලයේ බෝග වර්ග **දෙකක්** නම් කරන්න.

(vi) සොලනේසියේ කුලයේ බෝගවලට නිතර වැළඳෙන බැක්ටීරියා රෝගයක් සඳහන් කරන්න.

(vii) මෙම වගා බිමට ලැබෙන ජල ප්‍රමාණය සීමිත ය. එබැවින් බෝග වගාව සඳහා යොදගැනීමට සුදුසු සූක්ෂ්ම ජල සම්පාදන ක්‍රම දෙකක් යෝජනා කරන්න.

(viii) ගොවිපොළේ තිබෙන භූගත කඳන් සහිත වල් පැළෑටි පාලනය සඳහා අනුගමනය කළ හැකි යාන්ත්‍රික ක්‍රමයක් සහ රසායනික ක්‍රමයක් සඳහන් කරන්න.

(ix) පස සාරවත් කිරීම සඳහා මෙම වගා බිමට යෙදීමට සුදුසු පූර්ණ පොහොර මිශ්‍රණයක අඩංගු විය යුතු ප්‍රධාන පෝෂක **තුන** නම් කරන්න.

(x) මෙම ගොවිපොළේ නිෂ්පාදනය කෙරෙන එළ එළවලු ගුණාත්මයෙන් යුතුව වෙළඳපොළට සැපයීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

**2.** රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශයක් පහත දැක්වෙයි.

"පසුගිය දින කිහිපය තුළ අනුරාධපුරය, වව්නියාව, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවලට ඇද හැළුණු ධාරානිපාත වර්ෂාව නිසා එම දිස්ත්‍රික්කවල ඇති වැව් සියල්ල ජලයෙන් පිරිගොස් ඇති අතර තවදුරටත් වර්ෂාව පැවතුනහොත් වැව් උතුරා යා හැකි බැවින් වාන් දොරටු විවෘත කිරීමට සිදුවන බව වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවසයි. මෙසේ ධාරානිපාත වර්ෂාව ඇතිවීමට හේතුව ඊසාන දිග මෝසම් සක්‍රිය වීම ය."

(i) (a) මෙම ප්‍රවෘත්ති ප්‍රකාශය කර ඇත්තේ වර්ෂයේ කුමන මාසයක විය හැකි ද?

(b) මෙම වර්ෂාව පදනම් කරගෙන වගා කෙරෙන කන්නය කුමක් ද?

(c) ඊසාන දිග මෝසම් වර්ෂාව වැඩියෙන් ලැබෙන්නේ දිවයිනේ කුමන කලාපයට ද?

(ii) (a) වර්ෂාපතනය මැනීම සඳහා භාවිත වන ඒකකය කුමක් ද?

(b) වර්ෂාපතනය මැනීමට භාවිත කරන උපකරණය කුමක් ද?

(c) ශ්‍රී ලංකාවට අඩුම වර්ෂාපතනයක් ලැබෙන මාස **දෙක** ලියන්න.

(iii) (a) හේන් ගොවිතැන සඳහා කැලෑ එළිකිරීම සිදු කෙරෙන්නේ කුමන මාසවල ද?

(b) සාමාන්‍යයෙන් ධාන්‍ය බෝගවල අස්වැන්න නෙළීම සිදු කෙරෙන්නේ කුමන මාසවල ද?

(c) වියළි කලාපයේ වාර්ෂික වර්ෂාපතන රටාව දළ ප්‍රස්තාරයක් මගින් දක්වන්න. (මාස සඳහන් කළ යුතු ය.)

[ හයවැනි පිටුව බලන්න.

3. ගොවි මහතෙක් අලෙවිය සඳහා එළවලු පැළ සහ පලතුරු පැළ නිෂ්පාදනය කිරීමට රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ගොවිපොළක් ආරම්භ කළේ ය.

(i) (a) එළවලු බීජ තවාන් දැමීම සඳහා යොදගත හැකි බඳුන් වර්ග **හතරක්** ලියන්න.

(b) දඬු කැබලිවල මුල් ඇදීම උත්තේජනය සඳහා යොදනු ලබන, වෙළඳපොළේ ඇති ද්‍රව්‍ය **දෙකක්** ලියන්න.

(ii) (a) බද්ධකිරීමට අනුජ ලබා ගැනෙන ශාකයක තිබිය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(b) බද්ධ කිරීමට ගනු ලබන ග්‍රාහකයක තිබිය යුතු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(c) බිමට නැමිය නොහැකි අත්තක් වායව ලේයර් ක්‍රමයට මුල් අද්දවා ගත හැකි ආකාරය රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) (a) වර්ධක ප්‍රචාරණයේ වාසි **දෙකක්** ලියන්න.

(b) අඹ ග්‍රාහකයකට කුස්සෑ බද්ධය සිදුකරනු ලබන ආකාරය රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.

4. සෂ්‍ය මාරු ගොවිතැන් ක්‍රමය අනුගමනය කරන ගොවි මහතෙක් තරමක් බෑවුම් සහිත තම වගා බිම කොටස් හතරකට බෙද එම කොටස් හතරෙහි එළවලු, අල, ධාන්‍ය හා රනිල යන බෝග වර්ග වගා කළේය.

(i) (a) මෙම භූමියේ පස සංරක්ෂණය සඳහා යොදගත හැකි යාන්ත්‍රික ක්‍රම **දෙකක්** සහ කෘෂිකාර්මික ක්‍රම **දෙකක්** නම් කරන්න.

(b) සෂ්‍ය මාරු ගොවිතැන් ක්‍රමයේ වාසි **හතරක්** ලියන්න.

(ii) (a) මෙම වගාව සඳහා යොදගත හැකි රනිල බෝග වර්ග **දෙකක්** ලියන්න.

(b) මෙම වගා ක්‍රමයේ එක් බෝගයක් ලෙස රනිල බෝග යොද ගැනීමේ වාසියක් ලියන්න.

(c) මෙම සෂ්‍ය මාරු ගොවිතැනේ බෝගයක් ලෙස කෙසෙල් හෝ අන්නාසි යොද ගැනීමට ඇති අපහසුතාව කුමක් ද?

(iii) (a) සෂ්‍ය බෝග මාරුව වෙනුවට සමෝධානිත ගොවිතැන යොදගතහොත් මෙම ගොවිපොළට අලුතෙන් එකතුවිය යුතු අංග **දෙකක්** සඳහන් කරන්න.

(b) පරිසර සංරක්ෂණයෙහි ලා සමෝධානිත ගොවිතැන් ක්‍රමය ආධාරවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

5. ශ්‍රී ලංකාවේ පලතුරු අස්වනුවලින් 40% ක් පමණ පසු අස්වනු හානි නිසා අපතේ යන බව වාර්තා වේ. එම නිසා පලතුරු පරිරක්ෂණය කිරීම, පලතුරු නිෂ්පාදනය මෙන්ම වැදගත් වේ.

(i) (a) පලතුරු අස්වනු නෙලීමේ සිට පරිභෝජනය තෙක් හානි සිදුවිය හැකි අවස්ථා නම් කරන්න.

(b) පලතුරු පරිරක්ෂණය කිරීමේ වාසි **දෙකක්** ලියන්න.

(ii) (a) ජෑම් සෑදීම සඳහා භාවිත කළ හැකි පලතුරු වර්ග **දෙකක්** නම් කරන්න.

(b) මිශ්‍ර පලතුරු බීම සෑදීම සඳහා පලතුරු වර්ග හතරක් භාවිත කෙරෙයි. ඉන් **දෙකක්** නම් කරන්න.

(c) ජෑම්/කෝඩියල් සෑදීමේදී යොද ගැනෙන පරිරක්ෂක ද්‍රව්‍යයක් නම් කරන්න.

(iii) (a) පලතුරු නිෂ්පාදන ඇසිරීම සඳහා යොද ගැනෙන බෝතල් ජීවාණුහරණය කරගනු ලබන ක්‍රමයක් කෙටියෙන් විස්තර කරන්න.

(b) පලතුරු නිෂ්පාදන අඩංගු බෝතල්වල අලවන ලේබලයෙහි ඇතුළත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

6. උඩරට තෙත් කලාපයේ සීමිත බිම් ප්‍රමාණයක් හිමි ගොවි මහතෙක් තම නිවසට යාබදව කිරිගවයන් දෙදෙනකුගෙන් යුත් ගව පාලන ඒකකයක් ආරම්භ කිරීමට අදහස් කළේ ය.

(i) (a) මෙහි ඇති කිරීමට යෝග්‍ය ගව වර්ග **දෙකක්** නම් කරන්න.

(b) එම ගවයින් ඇති කිරීමට යෝග්‍ය ක්‍රමය කුමක් ද?

(c) මෙම ගවයින්ට ලබාදිය හැකි සාන්ද්‍ර ආහාරයක් සහ දළ ආහාරයක් වෙන් වෙන්ව සඳහන් කරන්න.

(ii) (a) කිරි ලබාගන්නා කාලයේදී මෙම ගවයින්ට වැළඳිය හැකි බුරුල්ල ආශ්‍රිත රෝගයක් නම් කරන්න.

(b) මෙම රෝගයේ රෝග ලක්ෂණ **දෙකක්** ලියන්න.

(c) මෙම රෝගය ඇතිවීම වැළැක්වීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ගයක් සඳහන් කරන්න.

(iii) (a) පිරිසිදු කිරි ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(b) ක්ෂුද්‍ර ජීවීන් යොදගෙන නිපදවිය හැකි කිරි නිෂ්පාදන **දෙකක්** සඳහන් කරන්න.

7. ගොවිමහතෙක් තම ගෙවත්තේ කුකුළු නිවාසයක් ඉදිකර එහි බිමට දහයියා අතුරා ඒ මත කිකිළියන් 100 දෙනකු ඇති කිරීම ආරම්භ කළේ ය.

(i) (a) මෙම කුකුළන් ඇති කිරීමේ ක්‍රමය කුමන නමකින් හැඳින්වේ ද?

(b) මෙම ක්‍රමයට කුකුළන් ඇති කිරීමෙන් ගොවියාට අත්වන වාසි **තුනක්** සඳහන් කරන්න.

(ii) (a) අතුරුණුව සඳහා දහයියා වෙනුවට භාවිත කළ හැකි වෙනත් ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

(b) අතුරුණුව වියළිව හා පිරිසිදුව පවත්වා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න.

(iii) (a) මෙම කිකිළියන්ගෙන් කිහිප දෙනෙකුට ආහාර අරුචිය හා ලේ මිශ්‍ර පාචනය ඇති වූ අතර ඔවුන් මලානිකව සිටිනු දක්නට ලැබුණි. මොවුන්ට වැළඳී ඇති රෝගය කුමක් ද?

(b) මෙම රෝගය රංචුවේ අනෙක් සතුන්ට බෝවීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

* * *